පුවත්පතක් මගින් යම් අයෙකුගේ ප්‍රකාශයක් උපුටා දැක්වීමේ දී, සියයට සියයක්ම ප්‍රවේශම් විය යුත්තේ නිරවද්‍යතාවය යනු අනිවාර්යයෙන්ම රැකිය යුතු ජනමාධ්‍ය ආචාරධර්මයක් බැවිනි. මෙහි බරපතල බවට උදාහරණයක් ලෙසින් දිවයින පුවත්පත මඟින් ප්‍රකාශයට පත්කළ මෙවකට නියෝජ්‍ය අමාත්‍ය නිමල් ලංසාගේ පහත ප්‍රකාශය දැක්විය හැක. පාර්ලිමේන්තුවේදී නිමල් ලන්සා විසින් 'මහින්ද රාජපක්ෂ ජනපතිතුමාගේ කාලයේ 2005 සිට 2015 දක්වා කාලයේදී ආයෝජන ක්‍රමිකව 200% කින්, 300% කින්, 400% කින් වැඩි වී ඇත' යනුවෙන් ප්‍රකාශ කරන්නට යෙදිණි (අදාල හැන්සාඩ් වාර්තාව ඇසුරෙනි). කෙසේ නමුත් දිවයින පුවත් පත මගින් මෙය වාර්තා කොට තිබුණේ උක්ත කාලය තුළ අපනයන 200% කින්, 300% කින් වැඩිවූ බවටයි. දිවයින උපුටා දැක්වූ ප්‍රකාශය නියෝජ්‍ය අමාත්‍ය නිමල් ලංසා විසින් නොකරන ලද්දක් පමණක් නොව, එය සංඛ්‍යාලේඛන අතින් ද වැරදි වන බව පෙන්වා දිය හැක.

මෙවන් සාවද්‍ය උපුටා දැක්වීමක් පෙන්වා දුන් පසුව වුවද දිවයින පුවත්පත මගින් එය නිවැරදි කිරීමක් හෝ කණගාටුව ප්‍රකාශ කිරීමක් කර නොමැති බවද මෙහිදී දැක්විය යුතු වේ.

මූලාශ්‍ර සඳහා පිවිසෙන්න :-

https://www.parliament.lk/uploads/documents/hansard/1568268587003827.pdf

#MediaEthicsSL #SinhalaPress #lka #Divaina